# අද්‍යතන ශ්‍රී ලාංකේය භික්ෂු සංස්ථාවෙහි ආචාරධර්මීය ගැටලු නිරාකරණයෙහිලා අට්ඨකථාගත ත්‍රිවිධ විනයධර ලක්ෂණයෙහි ප්‍රායෝගික අදාළතාව

**කැලණියේ ධම්මගවේසී හිමි**[1]

## හැඳින්වීම

දීර්ඝ කාලීන ඓතිහාසික පරිණාමයකට උරුමකම් සපයන ශ්‍රී ලාංකේය භික්ෂු සමාජය සසුනෙහි චිරස්ථිතිය උදෙසා මෙන් ම ධර්ම විනයෙහි සුරක්ෂිතතාව සඳහා යුගයෙන් යුගය කැපී පෙනෙන මෙහෙවරක නිරත විය. එහෙත් විසි එක්වන සියවසේ පවත්නා දැඩි වාණිජකරණය, තාක්ෂණික දියුණුව හා ගෝලීයකරණ ප්‍රවණතා හමුවේ වත්මන් භික්ෂු සමාජය දැඩි සමාජ සංස්කෘතික පරිණාමයකට ලක්වෙමින් පවතී. මෙම නවීකරණයෙහි ප්‍රතිඵලයක් ලෙස සාම්ප්‍රදායික ශාසනික වටිනාකම් ගිලිහී යාමත්, ශික්ෂාපද කෙරෙහි පවත්නා ගෞරවය හීන වීම හේතුවෙන් අද්‍යතන ශ්‍රී ලාංකේය භික්ෂු සමාජයෙහි බරපතළ ආචාර ධර්මීය අර්බුද රැසක් නිර්මාණය වී ඇත. භික්ෂු පෞරුෂයට නොගැළපෙන හැසිරීම් විනය විරෝධී ක්‍රියාකාරකම් හා ශාසනික ප්‍රතිපදාවෙන් බැහැරවීම හේතුවෙන් පොදු මහජනතාව තුළ භික්ෂුව කෙරෙහි පැවති ශ්‍රද්ධාව හා ගෞරවය ගිලිහී ගොස් ඇති බව දක්නට ලැබීම ඛේදනීය තත්ත්වයකි. මෙම අර්බුදකාරී වටපිටාව තුළ භික්ෂු සමාජයෙහි ආචාර ධර්මීය ස්ථාවරත්වයෙහි පුනර්ජනනය උදෙසා සමන්තපාසාදිකා විනයට්ඨකථාවෙන් පැනෙන ත්‍රිවිධ විනයධර ලක්ෂණයෙහි ප්‍රායෝගික අදාළතාව උක්ත ගැටලුව සඳහා විසඳුම් සපයන නිරවද්‍ය දිශානතියකි.

විනයෙහි ප්‍රවීණත්වය නොහොත් විනය පිටකය (පෙළ) අට්ඨකථා (පරිපුච්ඡා) වශයෙන් සුවිනිශ්චිතව උද්ග්‍රහණය කොට තිබීම, විනයෙහි පිහිටා සිටීම හා අසංහීරව නොසැලී සිටීම වූ විනයෙහි ලජ්ජිභාවය හා විනයෙහි ස්ථිරවම සිට පෙළ අරුත් ඉදිරිපත් කිරීම, උපාලි මහතෙරුන් වහන්සේ සිට තම වංශ පරම්පරාව මනාව දැන ගනිමින් සිත්හි ධාරණය කොට ගැනීම නම් වූ ආචාර්ය පරම්පරාව පිළිබඳ අවබෝධය යන ලක්ෂණ ත්‍රිත්වයයි. එබැවින් මෙම ත්‍රිවිධ විනයධර ලක්ෂණ හුදෙක් න්‍යායාත්මක ධර්ම කරුණු සමුදායක්ම පමණක්ම නොව, භික්ෂුවගේ ශික්ෂණය, චර්යාත්මක පද්ධතිය, ආයතනික සුභ සිද්ධිය උදෙසා භාවිත කළ හැකි සජීවී ආදර්ශයන්ය. ශාසනික අර්බුධ නිරාකරණය කරමින් එහි සුප්‍රතිෂ්ඨිතභාවය උදෙසා අට්ඨකථාගත ත්‍රිවිධ විනයධර ලක්ෂණ වර්තමාන ප්‍රායෝගික සන්දර්භය තුළ කෙසේ අදාළ කර හැකි ද? යන්න පිළිබඳ විචාරාත්මක විශ්ලේෂණයක් ඉදිරිපත් කිරීම මෙහිලා අධ්‍යාශයයි.

## පර්යේෂණ අරමුණ

ශ්‍රී ලාංකේය භික්ෂු සමාජයෙහි වර්තමානයෙහි උද්ගත වී ඇති ආචාර ධර්මීය හා විනයානුකූල අර්බුද විමර්ශනය කරමින් ඒවා නිරාකරණය කිරීම උදෙසා අට්ඨකථාගත

1 පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය, කැලණිය විශ්වවිද්‍යාලය.
Kelaniyadhammagavesi@gmail.com

ත්‍රිවිධ විනයධර ලක්ෂණ වත්මන් ශාසනික අභියෝගතා හමුවේ සාර්ථකව උපයෝගී කරගත හැකි ආකාරය පිළිබඳ විචාරාත්මකව විශ්ලේෂණය කිරීම මෙහිලා පර්යේෂණ අරමුණයි.

**පර්යේෂණ ගැටලුව**

අද්‍යතන ශ්‍රී ලාංකේය භික්ෂු සමාජය මුහුණ දෙන සදාචාරාත්මක හා ආචාරධර්මීය අර්බුදයන් සාර්ථකව නිරාකරණය කර ගනිමින් ශාසනික පාරිශුද්ධිය ළඟා කර ගැනීම උදෙසා සමන්තපාසාදිකා විනයට්ඨකථාගත ත්‍රිවිධ විනයධර ලක්ෂණ වත්මන් ප්‍රායෝගික සන්දර්භය තුළ ප්‍රතිපත්තියක් වශයෙන් ආදේශ කරගත හැකි ද? යන්න මෙහිලා අධ්‍යයනයට ලක් වූ පර්යේෂණ ගැටලුවයි. එමෙන්ම වර්තමාන භික්ෂු අධ්‍යාපනය හා ශාසනික පරිපාලනය තුළ මෙම ත්‍රිවිධ විනයධර ලක්ෂණ ප්‍රායෝගිකව ක්‍රියාවට නැංවිය හැකි උපාය මාර්ගික ප්‍රවේශයක් වේද? යන්න මෙහිලා අධ්‍යයනයට ලක් වූ උප පර්යේෂණ ගැටලුවයි.

**පර්යේෂණ ක්‍රමවේදය**

මෙම පර්යේෂණය ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය යටතේ සිදු කරන අතර එහිලා මූලික වශයෙන් ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍රය ඇසුරින් දත්ත එක් රැස්කොට දත්ත විශ්ලේෂණය කරන ලදි. එහිලා අට්ඨකථාගත විශ්ලේෂණය හා වත්මන් භික්ෂු සමාජයෙහි අර්බුදකාරී තත්ත්වයන් ඔස්සේ තේමාත්මක විශ්ලේෂණයක් ද සිදු කරන ලද අතර විෂය ක්ෂේත්‍රයෙහි ප්‍රාමාණිකයන් සමඟ ද සම්මුඛ සාකච්ඡා පවත්වමින් දත්ත එක් රැස් කොට දත්ත විශ්ලේෂණය කරන ලදි.

**සාහිත්‍යය විමර්ශනය**

ත්‍රිවිධ විනයධර ලක්ෂණ පිළිබඳ ඉදිරිපත් වන්නේ සමන්තපාසාදිකා විනයට්ඨකථාවෙහි පඨම පාරාජික කාණ්ඩයේදීය. ඒ හා සම්බන්ධ තදානුගත සාරත්ථදීපනී හා විමතිවිනෝදනී ආදී ටීකා ග්‍රන්ථයන් තුළ ද මේ සම්බන්ධ විවරණ සපයයි. දෙපානම සුගතබන්ධු හිමියන් විසින් සංස්කරණය කරන ලද සංඝාධිකරණ ලේඛන සමුච්චයෙහි හා නිතලව ඥානිස්සර හිමියන්ගේ අධිකරණ විනිශ්චය යන ග්‍රන්ථයන් තුළ ද මේ පිළිබඳ විවරණ සපයයි. මිරිස්සේ ධම්මසිරි හිමියන්ගේ සංඝාධිකරණ ජෝතිකා ග්‍රන්ථයේ ත්‍රිවිධ විනයධර ලක්ෂණ පිළිබඳ ප්‍රාමාණික විවරණයක් සපයයි. එනමුත් අද්‍යතන ශ්‍රී ලාංකේය භික්ෂු සංස්ථාවෙහි ආචාර ධර්මීය අර්බුද නිරාකරණයෙහි ලා ත්‍රිවිධ විනයධර ලක්ෂණයෙහි ප්‍රායෝගික අදාළතාවය පිළිබඳ පර්යේෂණ සිදු වී නොමැති තරම්ය.

**ප්‍රතිඵල හා සාකච්ඡාව**

විනයධරයෙකු සතු විය යුතු ප්‍රධාන ලක්ෂණ ත්‍රිත්වයෙහි විනය ප්‍රවීණත්වය තුළින් විනය පෙළ හා අටුවාව පිළිබඳ ඥාණයත්, විනයෙහි පිහිටා සිටීම හා අසංහිරව නොසැලී සිටීම තුළින් ප්‍රතිපත්තිගකරුක බවත්, ආචාර්ය පරම්පරාව මනාව දැනගෙන සිටීම තුළින් සම්ප්‍රදාය රැකීම යන්නත් ස්ඵුට කරයි. වර්තමාන ශ්‍රී ලංකාවේ සමාජ මාධ්‍ය හා විවිධ මාධ්‍ය ක්ෂේත්‍ර ඔස්සේ ධර්ම විනය විකෘති කිරීම මූලික කොට නිවැරදි පෙළ

අටුවා ඔස්සේ ධර්ම විනය සන්නිවේදනය වීමක් ගම්‍ය නොවන තරම්ය. එබැවින් ඒ සඳහා ඊනියා අර්ථකථන දීම් බහුලව පවතී. එබැවින් අට්ඨකථාවට අනුව සැබෑ විනයධරයා විනය පාළිය මෙන්ම එහි අර්ථ නිරූපණය වූ අටුවාව පිළිබඳ ප්‍රවීණයකු විය යුතුය. වත්මන් භික්ෂු සමාජය තුළ දක්නට ලැබෙන තවත් ආචාරධර්මීය බිඳවැටීමක් ලෙස භික්ෂු සමාජය දැඩි ලෙස දේශපාලනීකරණය වීම දැක්විය හැකිය. අසංහීර වූ අනුන් විසින් තමන්ගේ මතය වෙනත් මගකට හැරවිය නොහැකි ස්ථාවර මට්ටමක පවත්වා ගත යුතු වේ. එබැවින් සැබෑ විනයධරත්වය තුළ විනය පෙළ අටුවාව පමණක්ම නොව විනයෙහි පිහිටා සිටීම ද පුරුදු පුහුණු වන බව පැහැදිලිය.

ඉහත කරුණු මූලික කොට බාහිර සමාජයෙන් හා මහජනයාගෙන් පැමිණෙන විවේචන හා අභියෝග හමුවෙහි විනයානුකූලව හා ඍජුව සිටීමට උපකාරී වේ. විනය අර්ථකථනය කිරීමේ දී තම සිතගි පරිදි ඉදිරිපත් නොකොට උපාලි තෙරුන්ගේ සිට පැවත එන ආචාර්ය පරම්පරාව හා මහා විහාරීය සම්ප්‍රදායික විනය විනිශ්චයන් පිළිබඳ මනා අවබෝධයක් විනයධරයෙකු සතුව පැවතිය යුතුය. අද්‍යතනයෙහි මහා විහාරීය සම්ප්‍රදායන් අතික්‍රමණය කරමින් හා පෞරාණික විනය විධීන් අවඥාවට ලක් කරමින් පුද්ගල කේන්ද්‍රීය ආශ්‍රම හා කල්ලි නිර්මාණය වී ඇත. එබැවින් වත්මන් ආචාරධර්මීය අර්බුදවලට ප්‍රධාන හේතුව ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා කෙරෙහි ආචාර්යන් වහන්සේලාගේ පාලනය හා උපදේශනය ගිලිහී යාමයි. අද්‍යතන ශ්‍රී ලාංකේය භික්ෂු සමාජයෙහි පවත්නා ආචාරධර්මීය අර්බුදයන්ට විසඳුම් ඇත්තේ බාහිර සිවිල් අධිකරණමය හෝ රාජ්‍ය නීති පද්ධතීන් තුළ නොව උක්ත ත්‍රිවිධ විනයධර ලක්ෂණ වැනි අභ්‍යන්තර ශාසනික ප්‍රතිපත්ති නැවත උද්දීපනය කිරීම තුළින්ම පමණක් බව කිව යුතුය.

**නිගමනය**

අද්‍යතන ශ්‍රී ලාංකේය භික්ෂු සමාජයෙහි ආචාරධර්මීය හා ව්‍යුහාත්මක අර්බුදයන් බාහිර නෛතික මැදිහත්වීම් මගින් නිරාකරණය කළ නොහැකි බවත්, ඊට අදාළ විසඳුමක් ලෙස ත්‍රිවිධ විනයධර ලක්ෂණ පාදක කොටගත් පෞරාණික ථෙරවාද මහා විහාරීය සම්ප්‍රදාය බලගන්වන අභ්‍යන්තර ශාසනික ප්‍රතිසංස්කරණයකට යොමුවීම තුළින් පමණක්ම වන බවත් නිගමනය කළ හැකිය.

**ප්‍රමුඛ පද** - අට්ඨකථාගත, අද්‍යතන, ආචාර ධර්මීය අර්බුද, ත්‍රිවිධ විනයධර ලක්ෂණ ශාසනික ප්‍රතිපදාවන්

**ආශ්‍රිත ග්‍රන්ථ**

**ප්‍රාථමික මූලාශ්‍රය**

*සමන්තපාසාදිකා I*, (1948). හේවාවිතාරණ අට්ඨකථා මුද්‍රණය.

*සාරත්ථදීපනිය*, (1999). *Chattha Sangayana CD Rom.* Igatpuri: Vipassana Research Institute.

**ද්විතීයික මූලාශ්‍රය**

අරියධම්ම හිමි, එන්. (2005). *සංක්ෂිප්ත භික්ෂු ශීලය*. අම්බලන්ගොඩ: ගුණවර්ධන යෝගාශ්‍රමය.

ඥානිස්සර හිමි, එන්. (1954). *අධිකරණ විනිශ්චය*. මීරිගම: ඒකනායක මුද්‍රණාලය.

ධම්මකුසල හිමි, ඒ. (පරි.), (2009). *සමන්තපාසාදිකා I සිංහල පරිවර්තනය*. දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

රතනපාල හිමි,ඒ. (සංස්.), (2017). *සංඝාධිකරණ ලේඛන සංග්‍රහය*. කොළඹ: ගොඩගේ ප්‍රකාශකයෝ.

සුගතබන්දු හිමි ,ඩී. (සංස්.), (2010). *සංඝාධිකරණ ලේඛන සමුච්චය*. මරදාන: සමයවර්ධන ප්‍රකාශකයෝ.